යම් සිදුවීමකට කාන්තා සහ පිරිමි පාර්ශවයන් දෙකම සම්බන්ධව ඇති අවස්ථාවන් හිදී පවා, කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට දක්වා වාර්තා කිරීම මාධ්‍ය ආචාර ධර්ම විරෝධී නොවන්නේ ද යන්න, Ethics Eye අපි මීන් පෙර බොහෝ අවස්ථාවන්හිදී මතු කර ඇති පැනයකි. පසුගිය ජූලි 13, 2022 දින අගමැති කාර්යාලයට පිවිසුණු විරෝධතාකරුවන් පිරිසක් තුවාල ලබා රෝහල්ගත කිරීමේ පුවත වාර්තා වී තිබූ ආකාරයද, එම පසුතලය ඔස්සේ විමසා බැලීමට හැක.

මෙම පුවත පුවත්පත් දෙකක් (ජූලි 14, 2022) ඔස්සේ වාර්තා වී තිබුණේ මෙසේයි.

"අරගලකරුවෝ අගමැති කාර්යාලයටත් පනිති, 39 ක් රෝහලේ, කාන්තාවෝ 2ක් ඒ අතර" - දිනමිණ

"අගමැති කාර්යාලයට ඇතුළු වීමට ගිය අරගලකරුවන්ට කඳුළු ගෑස් හා ජල ප්‍රහාර, 40 ක් රෝහලේ" - දිවයින

1. විරෝධතාවයන්ට සහභාගී වූ පිරිස් රෝහල් ගත කිරීම සම්බන්ධයෙදී ස්ත්‍රී පුරුෂ භාවය අදාළ වන්නේ කෙසේද? ඔබ සිතන ලෙසට මෙහිදී දිනමිණ පුවත් වාර්තාව කාන්තාවන්ව ඉස්මතු කොට දක්වා ඇත්තේ මන්ද?

2. එසේ නම් එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීමක් නොවන්නේ ද?

3. දිවයින පුවත්පත් වාර්තාව තුළ ස්ත්‍රී පුරුෂ භාවයක් ඉස්මතු නොකොට එම පුවතම වාර්තා කර ඇති ආකාරය වඩාත් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල යැයි ඔබ නොසිතන්නේ ද?

අදාළ නොවන තැන කාන්තාවන්ව ඉස්මතු නොකරමු!